"ජනතා හිතවාදී හා ඵලදායී රාජ්‍ය සේවයක් උදෙසා"

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
ஆளுநர் செயலகம் - தென் மாகாணம்
Governor's Secretariat - Southern Province

| මගේ අංකය / எனது இல. / My Number | G/SP/1/1/2//2024 [i] | ඔබේ අංකය / உமது இல. / Your Number | | දිනය / திகதி / Date | 2024.06.05 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම**
**- සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ 02-61/2024 සහ 02/76/2024**

ශීර්ෂගත කරුණ සම්බන්ධව මා වෙත යොමු කරන ලද ඔබගේ අංක CSS/7/13/1 හා 2024.06.05 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපිය මගින් ඉල්ලා සිටි පරිදි, දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව, පහත සඳහන් චක්‍රලේඛයෙහි විධි විධාන, දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා 2024.06.05 දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාදී ඇති බව කාරුණිකව දන්වා එවමි.

| චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛයේ අංකය | චක්‍රලේඛයේ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 02-61/2024 | 2024.04.08 | රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සඳහා රාජකාරි බාධා, පැමිණ සිටීමේ හා ප්‍රවාහන දීමනා (DAT) ගෙවීම සංශෝධනය කිරීම |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 02/76/2024 | 2024.05.08 | සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා විශේෂ රාජකාරි දීමනාව ගෙවීම |

04. ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද, ඉහත චක්‍රලේඛ වල පිටපත් දෙකක් මේ සමග කාරුණිකව යොමු කරමි.

එච්.ඩී.ඩී.එස්.එච්. හේරත්,
සහකාර ලේකම්,
ආණ්ඩුකාර ලේකම් වෙනුවට,
දකුණු පළාත.

එච්.ඩී.ඩී.එස්.එච්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk

දුරකථන | ) 0112669192 , 0112675011
தொலைபேசி | ) 0112698507 , 0112694033
Telephone | ) 0112675449, 0112675280

ෆැක්ස් | ) 0112693866
பெக்ஸ் | ) 0112693869
Fax | ) 0112692913

විද්‍යුත් තැපැල | ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி | )
E-mail | )

වෙබ් අඩවිය | ) www.health.gov.lk
இணையத்தளம் | )
Website | )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය | ) MH/TA/G/PSM/03/
எனது இல | ) 2024
My No. | )

ඔබේ අංකය | )
உமது இல | )
Your No. | )

දිනය | ) 2024.05. 08
திகதி | )
Date | )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02/76/2024

ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
මහනුවර ජාතික රෝහලේ අධ්‍යක්ෂ,
සියලුම ශික්ෂණ රෝහල් සහ මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියලුම මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරීවරුන්,
ඇතුළු සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,

**<u>සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා විශේෂ රාජකාරී දීමනාව ගෙවීම</u>**

මෙම රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය... 02/76/2024 චක්‍රලේඛය / ... ලිපිය ... දින සිට ... ගරු අණ... 2024/06/05 ... දින ලබා දී ඇති ...

එච්.එම්.සී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
සහකාර ලේකම් කාර්යාලය

උක්ත කරුණ සම්බන්ධයෙන් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/0752/610/033 හා 2024.04.10 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ නිර්දේශිත කරුණු සඳහා 2024.04.29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

02. ඒ අනුව, දැනටමත් විශේෂ රාජකාරී දීමනාව ගෙවනු ලබන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා රු.3,000.00 සහ රු.1,000.00 බැගින් ගෙවනු ලබන දීමනාව 2024 මැයි මස සිට දෙගුණ කර ගෙවීමට කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

03. එසේම, මේ සඳහා දැරීමට සිදුවන වියදම සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2024 අයවැය ප්‍රතිපාදන තුළ කළමනාකරණය කර ගැනීමට යටත්ව ඉහත ගෙවීම් අනුමත කර ඇති බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

වෛද්‍ය පී.ජී. මහිපාල,
ලේකම්.

වෛද්‍ය පී. ජී. මහිපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්,
i. සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
ii. සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන් - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
iii. සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
iv. සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා